# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1619/25 - 2009 සැප්තැම්බර් 18 වැනි සිකුරාදා - 2009.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

අංක 1588/17 දරන 2009.02.11 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධිත, අංක 1235/21 දරන 2002 මැයි මස 08 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

(01) 05 වැනි ඡේදයේ (i) උපඡේදය ඉවත් කර ඒ වෙනුවට නව 05 (i) උපඡේදය ආදේශ කෙරේ.

"05 (i) තීරණය කරනු ලබන නිශ්චිත දිනයක ට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ තනතුරුවල ඇති වන පුරප්පාඩු පිරවීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් විවෘත හා සීමිත අපේක්ෂකයින් වෙනුවෙන් වෙන වෙනම තරග විභාග දෙකක් පවත්වනු ලැබේ. එහෙත් විවෘත හා සීමිත අපේක්ෂකයින් දෙවැනි උපලේඛනයේ සඳහන් පළමුවැනි (පොදු) ප්‍රශ්නපත්‍රයට පෙනී සිටිය යුතුවේ. දෙවැනි උපලේඛනයේ සඳහන් විෂය නිර්දේශය අනුව විවෘත හා සීමිත අපේක්ෂකයින් සඳහා වෙන වෙනම ප්‍රශ්නපත්‍ර සකස්කරනු ලබන අතර අපේක්ෂකයින් තමන් ඉල්ලුම් කරන තනතුරට අදාළව එක් විෂයානුබද්ධ ප්‍රශ්නපත්‍රයකට අනිවාර්යෙන්ම පෙනී සිටිය යුතුය. එකී තරග විභාගයේ ප්‍රතිඵල මත මෙහි පහත අංක 6,7 හා 8 දරන වගන්ති යටතේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව කොමිෂන් සභාව විසින් බඳවාගැනීම් කරනු ලැබේ."

05 වැනි ඡේදයේ (ii) උපඡේදය හා සටහන් 1 හි "පොදු තරග විභාගය" යන්නෙන් "පොදු" යන වචනය ඉවත් කරනු ලැබේ.

(02) 06 වැනි ඡේදයේ (i) උපඡේදයේ 2 වැනි හා 3 වැනි පේළිවල සඳහන් " කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 80% ක් ද," යන්න "කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 60% ක් ද " වශයෙන් සංශෝධනය කරනු ලැබේ.

(03) 06 වැනි ඡේදයේ (iii) උපඡේදයේ 4 වැනි පේළියේ 50% යන්න 40% වශයෙන් සංශෝධනය කරනු ලැබේ.

(04) 6 වැනි ඡේදයේ (vi) උපඡේදයේ 'අ' සිට 'ඈ' දක්වා සුදුසුකම්වලට අමතරව –

'අ' හි iii ලෙස ද,
'ආ' හි iv ලෙස ද,
'ඇ' හි iv ලෙස ද,
'ඈ' හි iv ලෙස ද,

"හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී කෘෂිකාර්මික තාක්ෂණ කළමනාකරණය පිළිබඳ සිවු අවුරුදු උපාධිය" යන්න එකතුකරනු ලැබේ.

1A - G 11737— 355 (2009/09)

(05) 07 (i) හා 07 (ii) උපඡේද පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ:-

07. **සීමිත බඳවා ගැනීම:**

(i) කෘෂිකර්ම නිලධාරි තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 66 2/3% පර්යේෂණ නිලධාරි තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40% ක් සහ කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40% ක් ද, විභාගයට පෙනී සිටින අවස්ථාවේ දී අයැදුම්කරුවන් දරන ලද තනතුරු සඳහා වෙන් කරනු ලබන පහත වගුවේ දැක්වෙන ප්‍රතිශතයනට සහ පහත III උපඡේදයෙහි විධිවිධානවලට අනුකූලව පුරවනු ලැබේ. කෙසේ වුව ද එකී ප්‍රතිශතයනට සරිලන සංඛ්‍යාවක් සීමිත බඳවා ගැනීම් යටතේ පත් කර ගැනීමට නොහැකි අවස්ථාවල දී, ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව විවෘත බඳවා ගැනීම්වලින් පුරවනු ලැබේ.

| *උපලේඛනගත තනතුර* | *විභාගයට පෙනී සිටින ලද අවස්ථාවේ දී දරන ලද තනතුර* | | |
|---|---|---|---|
| | *කෘෂිකර්ම උපදේශක/ උද්‍යාන සහකාර/ කෘෂි මෙහෙයුම් නිලධාරි/ වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)* | *පර්යේෂණ සහකාර/ පාංශු සමීක්ෂක/ ඉඩම් ඇගයීමේ නිලධාරි/ කෘෂි මෙහෙයුම් නිලධාරි/ වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)* | *ආර්ථික විද්‍යාඥ සහකාර/ කෘෂි මෙහෙයුම් නිලධාරි/ වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)* |
| කෘෂිකර්ම නිලධාරි | 66 2/3% | - | - |
| පර්යේෂණ නිලධාරි | - | 40% | - |
| කෘෂි ආර්ථික විද්‍යාඥ | - | - | 40% |

(ii) **සුදුසුකම් ලබන නිලධාරීන් :**

අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට, පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබෙන –

(අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ විශේෂ පංතියේ කෘෂිකර්ම උපදේශක, පර්යේෂණ සහකාර, පාංශු සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරු දරන නිලධාරිහු.

(ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ 1 පංතියේ අවම වශයෙන් වසර 04 ක සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබෙන කෘෂිකර්ම උපදේශක, පර්යේෂණ සහකාර, පාංශු සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරු දරන නිලධාරිහු.

(ඇ) වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂි මෙහෙයුම් නිලධාරි හා වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) තනතුරු දරන නිලධාරිහු (මෙම තනතුරක් දරන සුදුසුකම්ලත් නිලධාරියෙකුට අයැදුම්කළ හැක්කේ ඉහත වගුවෙහි දක්වා ඇති උපලේඛනගත තනතුරු 3 අතරින් එකකට පමණි.)

(ඈ) වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආර්ථික විද්‍යාඥ සහකාර තනතුරු දරන නිලධාරිහු.

(ඉ) වසර 10 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති උද්‍යාන සහකාර තනතුරු දරන නිලධාරිහු.

(ඊ) වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂිකර්ම විද්‍යා හෝ විද්‍යා උපාධියක් සහිත කෘෂිකර්ම උපදේශක, උද්‍යාන සහකාර, පර්යේෂණ සහකාර, පාංශු සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරිහු.

(06) 07 වැනි ඡේදයේ (iii) (ආ) උපඡේදයේ 50% යන්න ඉවත් කර ඒ වෙනුවට 40% යන්න ආදේශ කෙරේ.

(07) 07 වැනි ඡේදයේ (iii) උපඡේදයේ සටහන 1 ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් නව 07 වැනි ඡේදයේ (iii) සටහන 1 ආදේශ කෙරේ:-

"අයැදුම්කරුවෙකු නියමිත සුදුසුකම් සපුරාලන දින සිට අයැදුම්පත් භාරගන්නා අවසාන දින දක්වා සේවය කළ සක්‍රිය කාල සීමාව පමණක් ජ්‍යෙෂ්ඨතාවයට ලකුණු ලබාදීම සඳහා ගණන් ගනු ලැබේ. ලකුණු 30 ක උපරිමයකට යටත්ව එම සක්‍රිය සේවා කාලයට ගැනෙන එක් වසරකට ලකුණු 02 ක් බැගින් ද දින 180 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් වෙනුවෙන් ලකුණු 01 බැගින් ද ප්‍රදානය කරනු ලැබේ."

(08) දෙවැනි උපලේඛනයේ 1 පර්යේෂණ නිලධාරි තනතුර සඳහා ප්‍රශ්නපත්‍රයේ (අ) කොටසෙහි ඇති විෂයයන් 06ට අමතරව අංක 07 යටතේ පහත සඳහන් විෂයය එකතු කරනු ලැබේ:-

**"07 කෘෂිකාර්මික රසායන විද්‍යාව :**

ජීව රසායන විද්‍යාවේ (Bio Chemistry) මූල ධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ජීව රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්,
ආහාර රසායන විද්‍යාවේ (Food Chemistry) මූල ධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ආහාර රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්,
විශ්ලේෂණාත්මක රසායන විද්‍යාවේ (Analytical Chemistry) මූල ධර්ම හා කෘෂිකර්මාන්තයේ දී විශ්ලේෂණාත්මක රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්."

(09) දෙවැනි උපලේඛනයේ 11 කෘෂිකර්ම නිලධාරි, කථිකාචාර්ය සහ විෂයානුගත විශේෂඥ තනතුරු සඳහා ප්‍රශ්නපත්‍රයේ විෂයයන් 06 ට අමතරව අංක 07 සහ 08 යටතේ පහත සඳහන් විෂයයන් එකතු කරනු ලැබේ:-

**"07 කෘෂිකර්ම ව්‍යාප්තිය හා පුහුණුව :**

කෘෂිකර්ම ව්‍යාප්තියේ විග්‍රහය හා පරමාර්ථ, කෘෂිකාර්මික සංවර්ධනය හා කෘෂිකර්ම ව්‍යාප්තිය, අලුත් ක්‍රම භාවිතය හා පතුරුවාලීම, සංනිවේදනය, ව්‍යාප්ති ඉගැන්වීමේ ක්‍රම, ශ්‍රී ලංකාවේ භාවිතා කෙරෙන ව්‍යාප්ති ප්‍රවේශයන්, පර්යේෂණ ව්‍යාප්ති සම්බන්ධතාවය, ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම, ව්‍යාප්ති වැඩසටහන් සුපරීක්ෂණය හා ඇගයීම, ශ්‍රී ලංකාවේ කෘෂිව්‍යාප්තිය හා සම්බන්ධ වූ ආයතන,
වැඩිහිටි අධ්‍යාපනය, පුහුණු කිරීමේ පිළිවෙල, පුහුණු අවශ්‍යතා හඳුනාගැනීමට භාවිතා කෙරෙන විවිධ ක්‍රම, පාඩම් සැලසුම් සැකසීම, පුහුණුව ඇගයීම, පුහුණුව සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ භාවිතය.

**08 බීජ තාක්ෂණය :**

බීජ කායික විද්‍යාව, බීජ ව්‍යුහය, බීජ රූප විද්‍යාව, බීජ ප්‍රරෝහණය, බීජ ශක්තිය, බීජ පරීක්ෂා කිරීම, බීජ ප්‍රරෝහන ශක්තිය හා පාරිශුද්ධතාවය පිළිබඳ පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථාවන්, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම."

(10) තුන්වැනි උපලේඛනයේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ වන ප්‍රශ්නපත්‍ර - 1 වැනි පත්‍රය මූල්‍ය ක්‍රම යටතේ වන (ඇ) "කච්චේරි මගින් විශේෂයෙන් කරගෙන යනු ලබන ගිණුම් පිළිබඳ ආඥාපනත් යන්න" ඉවත් කරනු ලැබේ.

එස්. අමරසේකර,
ලේකම්,
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 17 වැනි දින,
බත්තරමුල්ල,
අංක 80/5, රජමල්වත්ත පටුමග,
"ගොවිජන මන්දිරය",
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ දී ය.

10-252

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.